**ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය**

----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දෙමළ පිටපත දින 25 ක ප්‍රමාදයකින් පසු 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරීම කළ යුතු වීම. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දෙමළ බසට පරිවර්තනය කිරීමේ කටයුතු සිදුකිරීම ප්‍රමාද වූ බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂය රු.181,734,104 ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ආරම්භක ශේෂය රු.150,466,027 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ස්ථාවර වත්කම්වල වටිනාකම රු. 69,481,220 ක් වුවද, ආරම්භක ශේෂයන්ගේ වෙනස හා භාණ්ඩාගාරයේ කරන ලද නිවැරදි කිරීම්වල එකතුව රු. 31,776,671 ක් ගලපා මිලදී ගැනීම් රු.101,257,891 ක් වශයෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල දක්වා තිබුණි | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් වෙනස්කම් නිරවුල් කර නිවැරදි ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේදී මිලදීගත් මෝටර් රථයේ අගය 2017 වර්ෂයේ ස්ථාවර වත්කම්වලට ඇතුලත් නොකිරීම ආරම්භක ශේෂයේ වෙනසට හේතු වී ඇත. සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් කාර්යාල උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම මෙම වෙනසට හේතුවී තිබෙන අතර ඒවා නිවැරදි කිරීමට නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** අත්තිකාරම් ගිණුමේ ලැබීම් ලෙස දක්වා තිබූ රු.14,618,027 ක ශේෂය තුළ රු.4,564,153 ක් වූ හරස් සටහන් වටිනාකමද ඇතුළත් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදි මූල්‍ය වටිනාකම් හඳුනාගැනීම කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳ අවබෝධයක් හා පුහුණුවක් නොතිබුණු බව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සීමිත කාලයක් තිබූ බව සහ ඉදිරියේදී අතපසුවීම් අවම වන ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. |
| **(ආ)** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පැවති රු.8,022,951 ක් වූ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම්වල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| **(ඇ)** වෙනත් අමාත්‍යාංශවලින් ලැබූ ප්‍රතිපාදනවලින් දරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.5,266,270ක් හා රු.605,796 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| **(ඈ)** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබූ රු.491,106 ක් වූ තැන්පතු ආපසු ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| **(ඉ)** රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ලැබී තිබුණු රු.10,053,874 ක වටිනාකම සහ නිලධාරීන්ට ගෙවා තිබූ රු.17,503,826 ක වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට ගලපා නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා පොලී, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වීම. | -එම- |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** 2018 නොපියවූ අත්තිකාරම් ශේෂය යටතේ වූ 2017 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.279,878 ක ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | විධිවිධානවලට අනුකූලව කටයුතු කර ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් දෙදෙනාගේ ණය ශේෂ එම අමාත්‍යාංශය සමග සම්බන්ධ වී නිරවුල් කර ගන්නා මෙන් අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී |
| **(ආ)** සේවය තහනම් කර ඇති සේවකයන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 වැඩි එකතුව රු.242,820 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතු වීම. | සේවකයින් දෙනෙකුගේ ණය අයකර ගැනීමට දිසා අධිකරණවල නඩු පවරා ඇති බව සහ එක් සේවකයකු සම්බන්ධයෙන් තොරතුරු නොමැති බැවින් එම ණය ශේෂය පොතෙන් ඉවත් කිරීමට ලේකම්ගේ අනුමැතියට යැවීමට කටයුතු කරමින් සිටින බව. |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි . | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනය පවත්වාගෙන යන ලෙස අදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. |

**(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි . | මුදල් රෙගුලාසි 454 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතු වීම. | ලේඛන පවත්වාගෙන යන යාම හා යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |

**(ඇ) හානි පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හි විධිවිධාන 110 යටතේ වන ආකෘතිය ප්‍රකාර හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | -එම- |

### 1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන හා කළමණාකරණ කමිටු තුලින් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම තවදුරටත් ශක්තිමත් කරන ලෙස අදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (3 ) | වාහන 02 ක් සම්බන්ධයෙන් සිදු වී තිබූ අනතුරු 03 ක් පිළිබඳව විගණිත දිනය වනවිටත් ප්‍රාරම්භක වාර්තා යවා නොතිබුණි. | අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කිරීම හා එයට වගකිව යුත්තන් හඳුනාගෙන පරීක්ෂණ ආරම්භ කල යුතු වීම. | අනතුරු සම්බන්ධ ප්‍රාරම්භක වාර්තා 2019 පෙබරවාරි 28 දින මුදල් අමාත්‍යාංශය වෙත යැවීමට පියවර ගෙන ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | සංචිත වාහන 26 ක් සම්බන්ධයෙන් 2018 ජුනි මාසයේ සිට දෙසැම්බර් දක්වා වූ දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව නියමිත කාලයේදී ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත්කල යුතු වීම. | ධාවනසටහන් පොත් යාවත්කාලීන කොට නියමිත කාලයේදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී. |
| **(ආ)** 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය | චක්‍රලේඛයේ ආකෘතිය ප්‍රකාරව ප්‍රවාහන සේවා පිළිබඳ වාර්තා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව වාර්තා පවත්වාගෙන යා යුතු වීම. | මේ වන විට ප්‍රවාහන සේවා පිළිබඳ ලේඛනයක් සකසා යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලැබේ. |
| **(ඇ)** 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.251,215,324 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර නොතිබුණි. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකල යුතු වීම. | 2018 දෙසැම්බර් මාසය දක්වාම ස්ථාවර වත්කම් පරිගණක ගත කිරීම සිදුවූ බැවින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි වුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | මූලධන වැය විෂයයන් **3** ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1.80 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වැය විෂය ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ඉල්ලුම් කරන ලද අග්‍රිම නොලැබීම ඉතිරියට හේතු වීඇත. |
| **(ආ)** | පුනරාවර්තන වැය විෂයයන් **5** ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 14.71 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 11.17 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු. මිලියන 3.54 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් හා සබරගමුව පළාත් මධ්‍යස්ථානය වසා දැමීම යන හේතු මත පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| **(ඇ)** | මූලධන වැය විෂයයන් **09** ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 294.60 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 182.68 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 111.92 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට **20** ක සිට සියයට **76** ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.. | -එම- | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කාර්යාලීය උපකරණ ලබා ගැනීමට අක් මුදල් නොලැබීම හා අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන සඳහා අක්මුදල් නොලැබීම හා නව බඳවා ගැනීම් සිදු නොවීම යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 14.20 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ බැරකම් ප්‍රකාශය අනුව එම මුදල රු.මිලියන 2.22 ක් අඩුවෙන් රු.මිලියන 11.97 ක් වශයෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | පෙර වර්ෂයේ බැදීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට කඩිනමින් වාර්තා කල යුතුව තිබූ බැවින් දළ වශයෙන් ඉතිරිවූ ප්‍රතිපාදන ප්‍රමාණය බැරකම් වශයෙන් පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සහජීවන සංගම් වෙත බෙදාහැරීම සඳහා 2017 දෙසැම්බර් 29 දින මිලදී ගෙන තිබූ පුටු 7500 න් රු. 561,104 ක් වටිනා පුටු 775 ක් 2019 මැයි 27 දින වනවිටත් බෙදා නොහැර ඉතිරිව තිබුණි. | සැලසුම් කරන ලද කාලය තුලදී අදාල වැඩසටහන් ක්‍රියාත්මක කර නිමකල යුතු වීම. | 2019 අප්‍රේල් 21 දින සිදුවූ කලබලකාරී වාතාවරණය මත ඉතිරි පුටු බෙදා දීමට නොහැකි වූ අතර ඉදිරි මාසවලදී එම පුටු සහජීවන සංගම් වෙත බෙදාහැරීමට කටයුතු සැලසුම් කර ඇත. |

**3.2 පාඩු හා හානි**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** 2018 ජූලි 01 දින අනතුරකට ලක් වී තිබූ මිට්ෂුබිසී ඩබල් කැබ් රථය 2019 මැයි මාසය දක්වාම අළුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමකින් තොරව නියෝජිත ආයතනයේ ගරාජයේ ගාල් කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් කඩිනම් මූලික පරීක්ෂණ කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වූ අලාභය අය කර ගැනීමට තිබූ අවස්ථාව මඟ හැරී තිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට හැකිවන පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව වූ පරීක්ෂණය කඩිනමින් සිදු කළ යුතු වීම. | වාහනයේ අලුත් වැඩියා කටයුතු සඳහා අවශ්‍ය air bag සහ ආසන පටි ජර්මනියෙන් ආනයනය කරන තුරු අළුත්වැඩියා කටයුතු නිම කිරීමට තරමක කාලයක් ගත වේ. |
| **(ආ)** 2018 ඔක්තෝබර් මාසයේදී මිලදීගත් රු.මිලියන 32.7 ක් වටිනා BMW වර්ගයේ මෝටර් රථය පළමු ධාවන අවස්ථාවේදීම ටයර්වලට සිදු වී තිබූ හානිය හේතුවෙන් රු.570,296 ක් වැය කර 2018 දෙසැම්බර් මාසයේදී නියෝජිත ආයතනයෙන් අළුත්වැඩියාව කරගෙන තිබුණි. 2019 ජනවාරි මාසයේදී නැවත ධාවනයේ යෙදවීමේදී, වාහනයට නියමිත ඉන්ධන වෙනුවට වෙනත් ඉන්ධන වර්ගයක් භාවිතා කිරීම හේතුවෙන් සිදු වූ දෝෂය අළුත්වැඩියා කිරීම සඳහා 2019 මැයි මාසයේදී රු.මිලියන 1.08 ක වියදමක් දරා තිබුණි. මෙම අළුත්වැඩියා දෙකටම අදාළ සිද්ධීන් තාවකාලික පත්වීම් ලත් නිලධාරීන් දෙදෙනෙකු අතින් සිදු වී තිබූ බව අනාවරණය විය. | වාහන අනතුරු හෝ දෝෂයන් ඇති වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පරීක්ෂණයන් සිදු කර අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එම අලාභයන්ට අදාළව ප්‍රාරම්භක වාර්තා සකස් කර යවා ඇත.එම රථය මේ වන විට අළුත්වැඩියාව සඳහා යොමු කර ඇති අතර අළුත්වැඩියා කිරිමට ඇස්තමේන්තුගත මුදල රු.1,089,788 ක් වේ. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාර සේවයේ III වන පන්තියේ නිළධාරීන් 110 ක් බඳවා ගැනීම සඳහා 2017 හා 2018 වර්ෂයන්හිදී අයදුම්පත් කැඳවා තිබුණි. බඳවා ගැනීමේ කටයුතු සඳහා රු. මිලියන 3.47 ක් වැයකර තිබුණද, 2019 මැයි 28 දින දක්වාම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතු වීම. | ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක විභාගයේ ලිඛිත කොටස 2018 සැප්තැම්බර් 16 දින ද වාචික කොටස 2019 පෙබරවාරි 25 දින ද පවත්වන ලද අතර එහි ප්‍රතිඵල ලද පසුව සම්මුඛ පරීක්ෂණය පවත්වා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |